# කතා බහට සංයමයක් (8 වන පාඩම)

## සිංහල භාෂාව හා සාහිත්‍ය - 7 ශ්‍රේණිය


*වයි. වී. පී .කේ. සේනාරත්න මෙය.*

*ර/බල/කෝංගහමන්කඩ විද්‍යාලය ,බලංගොඩ.*




- එදිනෙදා මිනිසුන් අතර ඇතිවන කතා බහෙ දී ඇහුම්කම් දීම සහ ආචාරශීලි බව වැදගත් වේ. පුද්ගල විවිධත්වය අනුව ද කතා කරන ආකාරය සහ සවන් දීම ඊට උචිත අයුරින් සිදු කළ යුතුය.

උදා :
* ගුරුවරුන් සමඟ සිදු කරන සංවාද
* ආගමික නායකයන් (භික්ෂූන්වහන්සේලා/පූජකවරුන්) සමඟ සිදු කරන සංවාද
* විවිධ ආයතන නිලධාරීන් සමඟ සිදු කරන සංවාද
* ඥාතින් හිතවතුන් අතර සිදු කරන සංවාද

- පුද්ගලයෙකු සමඟ කතා බහ කිරීමේ දී,

  ♣සංවර බව.

  ♣අවස්ථාවට ගැලපෙන හඬකින් කතා බහ කිරීම.

  ♣ඇහුම්කන් දීමෙන් අනතුරුව පිළිතුරු ලබා දීම.

  ♣ඒ ඒ පුද්ගලයාට හා අවස්ථාවට උචිත වචන භාවිතය.

  ♣ගැලපෙන අංගචලන භාවිතය.

  ♣ පැහැදිලිව කතා බහ කිරීම.

  ♣ආවේගශීලි නොවීම.

යන කරුණු වැදගත් වේ

* දරුවනේ අටවන පාඩමෙන් අපට ඉගෙන ගන්න තියෙන්නේ කිසියම් සංවාදයක දී ඉතා සංයමයෙන් හා ආචාරශීලිව කතා බහ කිරීමෙන් යහපත් පුද්ගලයෙකු බවට පත්වීම සඳහා වැදගත් වන බවයි.

## පළමුවැනි සංවාදය

ස්ථානය : ජියුගාවෝකා දුම්රිය නැවතුම් පොළ

ටොට්ටෝ චං



1) මම මේක තියා ගන්න ද?

# ටිකට් එකතු කරන්නා

2) බැහැ, ඔයාට ඒක තියා ගන්න බැහැ

3) මේ ඔක්කොම ඔයාගෙ ද ?

4) නෑ, නෑ, ඒවා අයිති දුම්රිය ස්ථානයට.

5) මං ලොකු වුණා ම ටිකට් විකුණන කෙනෙක් වෙන්න ඕනෑ.





*

6)මගේ චූටි පුතාටත් දුම්රිය පොළේ රස්සාවක් ඕනෑ ලු. ඔව්, ඔයාටත් එයත් එක්ක වැඩ කරන්න පුළුවන්.




7)මං ලොකු වුණාම ටිකට් එකතු කරන කෙනෙක් වෙනවා

8)මං හිතුවේ ඔයා ඔත්තුකාරියක් වෙන්න යනවා කියලා.




9)ඔත්තු බලන ගමන් ම ටිකට් විකුණන කෙනෙකුත් වෙන්න මට බැරි ද?



* දඟකාර ජපන් දැරියක හා අසිරිමත් පාසලක් පිළිබඳව ලියැවුණු ජපන් ජාතික ටෙට්සුකෝ කුරොයානගී ලියූ ලීලානන්ද ගාමාච්චි මහතා විසින් පරිවර්තනය කළ හරි පුදුම ස්කෝලේ පොත ඇසුරින් සකස් කර ගත් සංවාදයකි.

එම සංවාදයෙන් එකිනෙකාට සාවධානව ඇහුම්කන් දීම සහ පිළිතුරු ලබා දීම, ටොට්ටෝ චංගේ මවත් තම දියණිය සහ ටිකට් එකතු කරන්නාගේ සංවාදයට බාධා නොකිරීම ද මෙම සංවාදයේ කැපී පෙනෙන ලක්ෂණයකි. එබැවින් ටොට්ටෝ චං සහ ටිකට් එකතු කරන්නා අතර ඇති වන්නා වූ මෙම සංවාදය හරි අපූරුය.



## * දෙවැනි සංවාදය

**ස්ථානය : නිමල්ගේ නිවස**



1)පුතා, උඹ යන්ට කැමති ද නුවර?

2)නෑ



3) ඇයි?



4) මට මෙහෙ හොඳයි





5)එහෙ
ගියොත් සුදු
අප්පෝ එක්ක
සෙල්ලම්
කරතෑකි

6)මෙහි
හිටියොත්
අප්පච්චිගේ
වැඩට උදවු
කරන්ට පුළුවනි
නොවැ

7)ඒකට කමක් නෑ උඹ
පලයන් නුවර ගෙදර
ගිහිල්ලා අම්මාට
කියලා මොකක්වත්
ඇඳගෙන කාරිය
වරෙන්







8) කවදා ද අප්පච්චි මං ආයෙ එන්නේ ?

9) මැණිකෙලා කී දවසක වරෙන්

10) අප්පච්චි කියන්නේ මට යන්ට ම කියලා ද?

11) ඔව්, ගිහින් වරෙන්, නැත්තං කුමාරිහාමිලා තරහ වෙයි.



* ටී. බී. ඉලංගරත්න මහතා විසින් රචිත අඹ යහළුවෝ නවකතාව ඇසුරෙන් මෙම සංවාදය සකස් කර ඇත.

මෙම සංවාදයේ දී නිමල් තම පියා සමඟ කතාබහ කරන්නේ ඉතාම ගරුසරුවය. එම සංවාදය තුළ ළෙන්ගතු බවද දක්නට ලැබේ.

නිමල් නුවරට යාමට අකමැති වුවත් නිමල්ගේ ප්‍රකාශයන් තුළ තරහක් දක්නට නැත. එය පවසන්නේ ආචාරශීලිව සහ කරුණාවන්ත ලෙසය.



ටී බී ඉලංගරත්න මහතා



* **තුන්වැනි සංවාදය**

ස්ථානය : ගැමි නිවසක්







1) අම්මේ, අපි ගිහින් එන්නම්.

2) මගේ පුතාට තුනුරුවන් පිහිටයි

3) අක්කේ

4) මොකද මල්ලි, මොනවත් බැරි වුණා ද?





5) ඕක තමයි. මම ඊයේ රෑත් කිවුවේ, ගෙන යන ඒවා හොඳ සිහියෙන් දා ගන්න කියලා



6) නෑ මං කතා කළේ මල් පාත්තිය බලා ගන්න කියන්න.
අක්කට බැරි නම් ලොකු නංගිටවත් කියලා වතුර දම්මවන්න ඕනෑ




7) නෑ මල්ලියෙ, මට පුළුවන් ඔය මල් පාත්තියට සාත්තු කරන්න.

* මඩවල එස්. රත්නායක මහතා විසින් රචිත අක්කර පහ කෘතියෙන් උපුටා ගත් සංවාදයකි.

සහෝදරයෙකු නිවසින් පිටව යද්දී තම අනෙක් සහෝදර සහෝදරියන් වගකීම් බාරගැනීමට ඉදිරිපත් වන අවස්ථාවක් ලෙස ද මෙම කතා බහෙන් පැහැදිලි වේ.

සහෝදර සහෝදරියන් අතර පවතින බැඳීම මත කෙනෙකු අනෙක් පුද්ගලයා වෙනුවෙන් කටයුතු කිරීමට පෙළඹෙන්නේ එම ඉල්ලීමෙහි පවතින කාරුණිකබව නිසාය.

බොහෝ පුද්ගලයන් අණ කිරීමකට වඩා ඉල්ලීමකට යහපත් ප්‍රතිචාර දක්වයි.



* **<u>හතරවැනි සංවාදය</u>**

ස්ථානය : පරගොඩ පන්සල



1) උපාසක මහත්තයෝ, අද බෝධි පූජාවේ ප්‍රධාන දායක තැන කවුද ?

2) අවසරයි, ලොකු හාමුදුරුවනේ ,අද බෝධි පූජාව විදානෙ රාලහාමිගේ ගෙදරින්.






3) විදානෙ රාලහාමි පැමිණිලා ද?
4) එහෙයි, හාමුදුරුවනේ. උන්නැහේ බුද්ධ පූජාවට ගිලන්පස සූදානම් කරනවා.
5) ඒ කටයුතු අහවර වුණා ම ආවාස ගෙට ඇවිත් මාව බැහැ දකින්ඩ කියනවා හොදයි. පොඩි හාමුදුරුවෝ පූජාවට වඩියි.



6) එහෙමයි, අපේ හාමුදුරුවනේ. මට යන්ඩ අවසර

7) හොඳයි. ගොහින් එන්ඩ.





* පූජ්‍ය පක්ෂය සමඟ සිදු කරන කතා බහක දී භාවිත කරනු ලබන භාෂාව ඉතාම සංවරව, ආචාරශීලිව හා ගෞරවාන්විතය. ඉහත සංවාදයෙන් ඒ බව මනාව පැහැදිලි වේ.

ඉතින් ආදරණීය දුවේ පුතේ, අපි එදිනෙදා කතා බහ කරන විට
අනෙක් පුද්ගලයාට සවන් දීම,
ඒ ඒ අවස්ථාවට ගැලපෙන ලෙස හඬ පාලනය කිරීම,
අනෙක් පුද්ගලයාගේ හිත රිදෙන අයුරින් කතා නොකිරීම,
ඉතාම විනීතව, සංවරව හා සංයමයෙන් කතා කිරීම
වැදගත් වෙනවා. එමඟින් යහපත් දරුවෙක් නිර්මාණය වීමට ද
ඉවහල් වෙනවා.



* **ලිඛිත අභ්‍යාස**

1) පළමුවැනි සංවාදයේ ටොට්ටෝ චංගේ මව සතු විශේෂ ලක්ෂණය කුමක් ද?

2) දෙවන සංවාදයේ නිමල් නුවර යාමට අකමැති වුවත් එය ප්‍රකාශ කළේ කෙසේ ද යන්න උපුටා දක්වන්න.

3) තුන්වන සංවාදයේ දී සහෝදර සහෝදරියන් අතර පවතින බැඳීම ඉස්මතු වන ප්‍රකාශය කුමක් ද?

4) විහාරාධිපති හිමියන් සහ උපාසක තැන අතර සිදු වන කතා බහේ දී භාවිත කර ඇති යෙදුම් කීපයක් හතර වන සංවාදයෙන් උපුටා දක්වන්න.

5) පාසලේ පැවැත්වෙන වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය පිළිබඳ තම හොඳම මිතුරා/මිතුරිය සමඟ කරන සුහද කතා බහ සංවාදයට නගන්න.

* 6) එදිනෙදා අප කතා බහ කරන විට දී සැළකිලිමත් විය යුතු කරුණු මොනවා ද?

*අට වන පාඩම හොඳින් නැවත වරක් කියවා ලිඛිත අභ්‍යාස (73 පිටුව) කරන්න.